# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நீதியானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


## <u>මාධ්‍ය නිවේදනයයි.</u>

නිදහස් හා සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් කටයුතු කළ සියලු පාර්ශවයන්ට නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය ලෙස (පැෆ්රල්) අපගේ ගෞරවය හා ප්‍රණාමය පිරිනමමු.

2015 ජනාධිපතිවරණ මැතිවරණයට අදාළව පූර්ව කාල සීමාව තුළ ප්‍රචණ්ඩකාරී තත්වයන් වාර්තා වුවද සමස්තයක් ලෙස මැතිවරණය සාමකාමී මට්ටමින් පවත්වාගෙන යාමට හැකිවීම සතුටට කරුණකි.

ජයග්‍රාහී කණ්ඩායම් සෙසු පක්ෂවල පරිස්වලට පහරදීමේ සිද්ධීන් ප්‍රදේශ රැසකින් වාර්තා වූ අතර පරාජිත වූ කණ්ඩායම්ද අවස්ථා 5කදී ප්‍රචණ්ඩකාරීව හැසිරී ඇති බව අප වෙත වාර්තා වේ. එසේම මෙම සිදුවීම් හරහා අවාසනාවන්ත ලෙස ජීවිත දෙකක් රටට අහිමි විය.

මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව අභිනව ජනාධිපතිවරයා විසින් සිදු කළ "සියලු දෙනාටම කායිකවත් මානසිකවත් සිත් තැවුලක් ඇති නොවන ලෙසට ජයග්‍රහණය සමරන්න." යන ප්‍රකාශය ගෞරවයෙන් හා ප්‍රශංසාත්මකව අගය කරන අතර දිනූ ජයග්‍රහණයේ වටිනාමක රැඳී පවතින්නේ සියලු පාර්ශවයන්ට ගෞරවනීය ලෙස සැලකීමෙන් හා ජයග්‍රහණය සාමකාමීව සැමරීමෙන් පමණක් බවත් අවධාරණය කරනු කැමැත්තෙමු.

මෙහිදී විශේෂයෙන්ම අවධාරණය කළ යුතු කරුණ වන්නේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය දේශපාලන නායකයින්ට සහ ප්‍රාදේශීය පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන්ට පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පාලනය කිරීම වෙනුවෙන් වැඩි වගකීමක් පැවරෙන බවය. ප්‍රචණ්ඩකාරී තත්වයන් වාර්තාවන මුල් අවස්ථාවේම එකී තත්වයන් පාලනය කිරීම හරහා සිදුවීම්වල ව්‍යාප්තිය අවම කර ගත හැකිය. මෙවැනි තත්වයන් පාලනය කිරීම වෙනුවෙන් ආගමික නායකයින්ට පැවරෙන කාර්යභාරය අතිමහත් වන අතර ඒ සඳහා තම අනුගාමිකයන් මෙහෙයවීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

එසේම දේශපාලන අස්ථාවරත්වයක් ඇති කිරීම සඳහා යම් යම් පාර්ශවයන් රට තුළ විවිධ කට කථා ප්‍රචාරයන් සිදු කරන බවට දැන ගැනීමට ලැබී ඇත. එවැනි කටයුතුවලට ඇති ඉඩ කඩ වලක්වමින් ජාතිය, ආගම වැනි සංවේදී කාරණාවලදී වඩා බුද්ධිමත්ව ජනතාව මෙහෙයවීම වග කිව යුතු සියලු පාර්ශවයන්ගේ කාර්යවන බව අප අවධාරණය කරමු.

<u>සමස්ත සිද්ධීන්වල වර්ගීකරණය</u>

| | |
|---|---|
| මනුෂ්‍ය ඝාතන | 02 |
| වෙඩි තැබීම් | 01 |
| බරපතල ගණයේ පහර දීම් | 04 |
| පහරදීම් | 08 |
| නිශ්චල දේපලවලට හානි කිරීම් | 11 |
| පෙළපාලි හා නීති විරෝධී රථ පෙළපාලි | 16 |
| රෝහල් ගත කිරීම් | 09 |

පශ්චාත් මැතිවරණ සමය තුළ ප්‍රචණ්ඩකාරීත්වයන් වාර්තා වූ ප්‍රදේශ ලෙසට කොළඹ, හම්බන්තොට, බදුල්ල, පුත්තලම, කළුතර යන දිස්ත්‍රික්ක ප්‍රමුඛ වන අතර එම ප්‍රදේශ කෙරෙහි වැඩි අවධානයකින් කටයුතු කරන ලෙස පොලිසය ඇතුළු සියලු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිමු.

මෙයට විශ්වාසී

විධායක අධ්‍යක්ෂ


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel : (+94) 11 2514441 / 11 2514442 Fax : (+94) 11 2514443
E-mail : paffrel@sltnet.lk Website : www.paffrel.lk